# පුස්වැල්ලේ මාස්වී ගොවිතැන්වල ප්‍රතිඵල

# Paddy Cultivation at Pussella.

පහත අත්සන්කරන මවිසින් 1928 සහ 1929 මාස්කන්නට සොරෙවු වී ගො තැන්වල විස්තර පහත දක්වමි.

පසුගිය ජනවාරි මාර්තු මාසවල පළවූ ගොවිකම් සඟරාවේ 24 වෙනි පිටුවේ පෙ යන ලිපියේ සඳහන් යල් ඉපනලි කුඹුරුවලින් කොටසක් වී බුසල බැගින් වෙ සාරගත් බුසල් 13½ක්ද අවුරුද්දට වරක් ගොවිතැන්කර බුසල් පහක්ද මුලු කුඹු කොටස් 18½ක් පහත විස්තරකරන අන්දමට ගොවිකම් දෙපාර්තමේන්තුවේ ම හතුන්ගෙන් ගුරුකම් ආධාර ඇතුව අත්හදා බැලීම පිණිස හී දෙක තුන හාලා පෝ ඇතුව සහ නොමැතිව නගුල් ගාලා හෝ පෝරු ගාලා මඩකලල්කර වී ජාති හයක් වපුරා වල් උදුරා තෙලීමෙන් සහ වල් උදුරා තෙලීම නොමැතිව පැළ සිටවාගෙ දෙකන්න ගොවිතැන් කිරීමේ ප්‍රතිඵල දක්වමි.

ගොවිතැන් දෙපාර්තමේන්තුවෙන් මට අත්හදා බැලීමට බාරදුන් මාස 6 ජී1 මාවී බුසල් 3½ක්ද, කුරුක්කන්ද කුඹුරෙ ලියද්දක 1928 සැප්තැම්බර් මස 24 වෙනි පවත්සාරගෙන එම ලියද්දත් සමගම කොටස් හයක් යල් ඉපනලි කුඹුරු හීදෙක හාලා ගොවිකම් දෙපාර්තමේන්තුවෙන් අත්හදා බැලීමට දුන් ලුනු සහිත පෝර

ඇට කුඩු, කලුපිටි මාලු යනාදි පෝර හොණ්ඩර 6¼ක් යොදා නගුල් ගාලා මඩ කලල් කරගත නොවැම්බ්‍ර මාසේ මුලදී පැළ සිටුවාගත 1929 ජනවාරි මස අග පිදී මාර්තු මස මැද පැසී කපා පාගා රෙඩ්ඩු හැර මැන බැලූවිට කොටසකින් බුසල් 22½ පටන් 39½ දක්වා වී ලැබුනි. එසේ අස්වනු අඩුව ලැබීමට හේතුව අවුරුද්දට දෙවර ගොවිතැන්කල යල් ඉපනලි කුඹුරු නිසත් නියමකලට වතුර නොමැති කමත් ටිකක් පසුවෙලා පැල සිටවීමෙන් ගොයම් මැරියාමෙන් හරිහැටි කිරිවැද පැසීමට ඉඩ නොලැබුනබව දෙපාර්තමේන්තුවේ කේ ඇස්. අරුමොගන් පරීක්ෂක මූලාදෑනි මහතාගේ දැකීම නිසා වැඩි විස්තර නොකරමි.

නවත් පත්තෑයම අබකුඹුර හතර ලියද්ද, කෝපිහේන යනාදි යල්ඉපනලි කුඹුරු කොටස් 7½ක් හිදෙක හාලා කොටස් 5½කට මවිසින් සපයාගත් ඇට පෝර හොණ්ඩර පහක්ද දෙපාතීමේන්තුවෙන් දුන් පෝර වලින් තුන්භාලක් දමා මාස 6යේ ජී 1 මාවී, මාස 7තේ සුදුමාවී පැළ සිටුවා, මාස 5 මුදුකිරියල්, වී මාස 4 හීනටීවී මාස 3½ මැඩඇල් යනාදි වී කොටස් පහ නොවැම්බ්‍ර මාසේ මැද වපුරා පැල සිටුවා වල් උදුරා තෙලීමෙන් හෝ නෙලීම නොමැතිව ජනවාරි මැද, පෙබරවාරි මුල පීදී පෙබරවාරි මැද මාර්තු අග පැසීමට කල්නොමතිව මැරීම නිසා කපා පාගා රෙඩ්ඩු හැර මැන බැලුවිට කොටසකින් බුසල් 9½ පටන් 21½ දක්වා වී ලැබුනි. පලමුවෙනි කොටසේ අන්දමට පැල සිටවීම නොකල නිසත් නිසිකාලේට වැස්ස නොමතිකමින් ප්‍රමාදවීමෙන් අන්තරා සිදුවීමෙන් හරි හැටි කිරි වැද පැසීමට කල් මදිවීමෙන් අන්තරා සිදුවීමෙන් හරිහැටි කිරිවැද පැසීමට කල්මදිවීමෙන් මැරී බොල් උන නිසා වී අස්වනු අඩුබව මතක්කරමි.

කිරල අත්ත, නිතුල, ගොඩකුඹල් ඔලුව යනාදි කුඹුරු කොටස් පහ අවුරුද්ද කට එකවර ගොවිතැන්කල කුඹුරු හීදෙක තුන හාලා මවිසින් සපයාගත් ඇට කුඩු හොණ්ඩර 4ක් දමා නගුල් ගාලා හෝ පෝරුගාලා මඩකර ගොවිතැන් කන් තෝරුවේන් මට බාරදුන් මාස 7 මාදම්පේ කාවලම් වීයෙන් තෝරාගත් සුදු සුලහී කොටස අගෝස්තුමස අන්තිම වපුරා, වතුර නොමතිව වල් උදුරා නෙලීම ඇතුව සහ නැතුව තරමක් හොඳින් ගොයම් වැඩී ගොස් ජනවාරිමස මැද පීදී පෙබරවාරි මස අගදී කපා පාගා රෙඩ්ඩු හැර මැන බැලුවිට කොටසකින් බුසල් 10 පටන් 17 දක්වා වී ලැබුනි. එම වී කොටස නොයෙක් ක්‍රමවලට කීප අවුරුද්දක්ම බෝකර අත්හදා බැලුවිට ගොයම් වැඩෙන අන්දමට කිසිසේත් අස්වනු නොලැබෙන නිසා අවට ගොවියෝ කිසි කෙනෙක් මේ පළාතට එම වීය පිළිගැනීමට අකමැතිබව කියමි

අමට සියලු ගොවියෝම හොඳසැටි වැඩකර පොරයොදා ගොවිතැන්කල වැඩී දෙ නකුට සාමාන්‍ය හොඳ අස්වනු ලැබුනි. තව සුළුප ගොවියෝ කොටසක් ඔවුන්ගේ හිතුමතේ හැටියට කාලසීමාව කල්පනා නොකර රටේ ගොවිතැන් කරන ටට කටයුතු කල අයගේ කුඹුරුවලට හිත්තර වී පමණවත් ලබාගැනීම නොලබීම නිසා කනගාටුවෙමින් පෝර යොදාගත හොඳට වැඩකර අවුරුද්දට දෙවරක් ගොවිතැන්කරමින් පැළ සිටවීම ඉතා හොඳබවට වැඩිදෙනෙක් අත්හදාබලාගත තිබේ.

පිටරට හාල් නොගෙන මේ රටම වී බෝකරගැනීමට පුලුවන් ආධාර ගුරුකම් දැන ඉගෙනීමට පුලුවන්වෙන ඉතා හොඳ ගරුකල හැකි ඥානවන්ත මහත්වරු වැඩි කෙනෙක් පිළිගෙන තිබෙන එක්සත් සහකාර සමාගම් ඇතිකරගෙන ජේරු දෙනියේ පලකරන ගොවිකම් සඟරා ගෙන්වාගෙන විවේක වෙලාවල්වල කියවා බලා කල්පනාකරමින් හොඳහැටි තේරුම්ගෙන කටයුතු කලාම ධාන්‍ය වැඩිකර-

ගන්ට පුළුවන්බව මගේ මැටහීම කරුණාවෙන් මතක්කරමි.

මීට,

එක්සත් සහකාර සමාගමේ සාමාජික තැන්පත්

ඒ. බී. පී. ඇම්. කළුබණ්ඩා,

හිටපු කෝරාල,

මාවතගම.

---